ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2256/23 - 2021 නොවැම්බර් මස 30 වැනි අඟහරුවාදා - 2021.11.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය, සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ, මුදල් අමාත්‍ය බැසිල් රාජපක්ෂ වන මවිසින් පනවනු ලබන රෙගුලාසි.

**බැසිල් රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි 2021 අංක 15 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි ලෙස හඳුන්වනු ලැබේ.

2. 2021 මැයි මස 06 දිනැති අංක 2226/48 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2021 අංක 07 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි සහ 2021 ජූලි මස 31 දිනැති අංක 2238/45 දරන *අතිවිශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද 2021 අංක 11 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි එහි සඳහන් භාණ්ඩ ආනයනයට අගතියක් නොවන සේ මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

3. මෙම රෙගුලාසි 2021 නොවැම්බර් 30 දින සිට බලාත්මක වේ.

4. සංශෝධිත, විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි පළකරන ලද 2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/40 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ I වන උපලේඛනයට, පහත සඳහන් භාණ්ඩ සහ ඒවාට අනුරූපී සටහන් මෙයින් ඇතුළත් කරනු ලැබේ.

1A - PG 5630 – 460 (2021/12)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| | **I තීරුව** *සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය* | **II තීරුව** *සංයෝජිත වර්ගීකරණ සංකේතය* | | **III තීරුව** *විස්තරය* | **IV තීරුව** *ආනයන පාලන බලපත්‍රය (L)* |
|---|---|---|---|---|---|
| **267** | **85.26** | | | **රේඩාර් උපකරණ, ගුවන් විදුලි මග පෙන්වීමේ ආධාරක උපකරණ සහ ගුවන් විදුලි දුරස්ථ පාලක උපකරණ.** | |
| | | | - | අනෙකුත්: | |
| | | 8526.91.00 | -- | ගුවන් විදුලි මග පෙන්වීමේ ආධාරක උපකරණ | **L** |
| | | | | | |

5. සංශෝධිත, විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි පළකරන ලද 2017 නොවැම්බර් 09 දිනැති අංක 2044/40 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ IV වන උපලේඛනයට, පහත සඳහන් භාණ්ඩ සහ ඒවාට අනුරූපී සටහන් මෙයින් ඇතුළත් කරනු ලැබේ.

| | **I තීරුව** *සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය* | **II තීරුව** *සංයෝජිත වර්ගීකරණ කේතය* | | **III තීරුව** *විස්තරය* | **IV තීරුව** *තහනම් කරන ලද (B)* |
|---|---|---|---|---|---|
| **17** | **29.31** | | | **අනෙකුත් කාබනික - අකාබනික සංයෝග :** | |
| | | | - | අනෙකුත් කාබනික - පොස්පරස් ව්‍යුත්පන්න : | |
| | | 2931.39.00 | -- | අනෙකුත් | |
| | | 2931.39.10 | --- | N-(පොස්පෝනෝමෙතිල්) ග්ලයිසීන් සහ එහි ලවන හා ව්‍යුත්පන්න (ග්ලයිෆොසේට්) | **B** |
| | | | | | |

EOG 12-0004